## පාඩම : විකසනය


1. සෘජුකෝණාස්‍රාකාර ප්‍රිස්මයක විකසනය ඇඳීම

දිග 30mm පළල 20mm උස 40 mm ප්‍රිස්මයේ විකසනය අඳිමු.

I. තිරස් රේඛාවක් ඇඳ ඒ මත ප්‍රිස්මයේ දිග සහ පළල පිළිවෙලින් ලකුණු කරන්න. එනම් 20mm, 30mm, 20mm, 30mm වන පරිදි ලකුණු කරන්න.

II. ලකුණු කළ ස්ථාන වලින් ලම්භක රේඛා ඇඳ ප්‍රිස්මයේ උස වන 40 mm බැගින් ලකුණු කරන්න. එම ලක්ෂ යා කරන්න.

III. සුදුසු ස්ථානයකින් පියන සහ පතුළ අඳින්න. ඒ සඳහා ලම්භක රේඛා දිගු කර 30mm × 20mm වන සෘජුකෝණාස්‍ර 02 ක් අඳින්න.



2. <u>සමපාද ත්‍රිකෝණාකාර ප්‍රිස්මයක විකසනය ඇඳීම</u>

පාදයක දිග 30mm වන සමපාද ත්‍රිකෝණාකාර ප්‍රිස්මයේ විකසනය අඳිමු. ( උස 50 mm)

I. තිරස් ර්ඛාවක් ඇඳ ප්‍රිස්මයේ පැත්තක දිග ( 30mm ) වන කොටස් 03ක් ලකුණු කරන්න.

II. ලකුණු කළ ස්ථාන වලින් ලම්භක රේඛා ඇඳ ඒ මත පිස්මයේ උස ලකුණු කරන්න.

III. ලකුණු කළ ලක්ෂ යා කරන්න.

IV. සුදුසු ස්ථානයකින් පියන සහ පතුළ අඳින්න. එනම් පාදයක් 30mm වන සමපාද ත්‍රිකෝණ 02ක් අඳින්න.

V. ඇතුළත රේඛා කඩ ඉරි මඟින් දක්වන්න.

